නරිදෙන සහ මැයිනිය

රුසියානු ජන කතාවකි

අනුවාදය
තක්ෂිලා සමන්ති ජයසේකර

ඉන්න එකෝමත් එක කාලෙක, මැයිනියක් පුංචි ගහක් උඩ කූඩුවක් හදාගෙන, ඒකේ බිත්තර දාලා ආදරයෙන් ඒවා රැක්කා. පුංචි මයින පැටවු එළියට ආව බව දැනගත්ත නරිදෙනක් ගහ ළඟ වාඩිවෙලා, තමන්ගේ වල්ගයෙන් වේගයෙන් ගහට තට්ටු කරන්නට වුණා. නරිදෙන මොකද කරන්නෙ කියලා අහපු මැයිනියට ලැබුණු පිළිතුර තමයි මේ:

"මගේ වල්ගෙන් ගහ කපනවා, ඊට පස්සේ ඔබත් ඔබේ පැටවුන්වත් මම ගිලිනවා."

හොඳට ම බය වුණු මැයිනිය, නරිදෙනට මෙහෙම ආයාචනා කළා:

"අනේ නරී අම්මා, මගේ ගහ කපන්න එපා! මම ඔබට කේක් සහ මී පැණි හොයලා දෙන්නම්."

නරිදෙන බොහොම සතුටින් කෑ ගැහුවා: "ඔහෝ, කදිමයි. කේක් එක්ක මී පැණි ලැබෙනවා නම් මම ගහ කපන්නෙ නෑ."

"හොඳයි, එහෙනම් මාත් සමඟ උස් මාවතට යන්න එන්න." එහෙම කිව්වේ මැයිනිය.

ඇය පියාසර කළේ නරිදෙනට පාර පෙන්වන ගමන්. එතකොට ම එයාලා දැක්කා කේක් කූඩයක් සහ මී පැණි බෝතලයක් අරගෙන ඈතින් එන වයසක ආච්චි අම්මා කෙනෙක් සහ ඇගේ මිණිපිරිය.

නරිදෙන පඳුරු අතරේ සැඟවුණා. මැයිනිය තමාට පියාඹන්න බැරි බව අඟවමින් විටෙක පියෑඹුවා, හැබැයි එකවර ම බිමට ඇදවැටුණා. ආයෙමත් ටිකක් ඉහළට අත්තටු ගසා, බිම දිගේ ම ඉදිරියට ඇදුණා.

"අනේ අපි අර කුරුල්ලව අල්ලගමු! " පුංචි ගැහැණු ළමයා කිව්වා.

"අපි කොහොමද එයාව අල්ල ගන්නෙ?" , එහෙම ඇහුවේ ආච්චි අම්මා.

ගැහැණු ළමයා මෙහෙම පිළිතුරු දුන්නා: "මට හොඳට ම විශ්වාසයි අපිට එයාව අල්ලගන්න පුළුවන්. එයාගේ අත්තටුවක් කැඩිලා වගේ. කොච්චර ලස්සන කුරුල්ලෙක් ද?"

ඉතින් ආච්චි අම්මාත් මිණිපිරියත් මයිනාව අල්ල ගන්න දිව ගියේ, එයාලා ළඟ තිබුණු කේක් කූඩය සහ මී පැණි බෝතලය බිමින් තියලයි.

චුට්ටක්වත් පමා නොවී නරිදෙන ඉක්මනින් ම පුළුවන් තරම් කේක් සහ මී පැණි ගිල දැම්මා. ඒ වගේ ම ඉතුරුවා හැංගුවා.

මැයිනිය බොහොම දක්ෂ විදියට එතැන මඟ ඇරලා, කූඩුවට පියාඹලා ආවා. හැබැයි ඉතින් ඇය කූඩුවට ඇතුළු වුණා විතරයි, නරිදෙන ආයෙමත් වල්ගයෙන් නොනවත්වා ගහට තට්ටු කරනවා.

"මගේ වල්ගෙන් ගහ කපනවා, ඊට පස්සෙ ඔබත් ඔබේ පැටවුන්වත් මම ගිලිනවා." ඔන්න ඉතින් නරිදෙනගෙන් කරදරේ.

මැයිනිය ආයෙත් කලබල වුණා: " අනේ නරී අම්මා, මගේ ගහ කපන්න එපා! මම ඔබට බොන්න බීර ගෙනත් දෙන්නම්"

නරිදෙනට බොහොම සතුටුයි. ඇය කෑ ගැහුවා: "ඔහෝ... මම හරි ම තිබහකින් ඉන්නේ. බොන්න බීර ලැබෙනවා නම් මම ගහ කපන්නෙ නෑ."

මැයිනිය ආයෙත් පියාඹාගෙන ගියේ, නරිදෙනට මඟ පෙන්වමින්.

කරත්තයක් උඩ බීර බැරලයක් තියාගෙන ගැමියෙක් හිටියා. ඔහුගේ වටේට වටේට කැරකුණු කිරිල්ලිය, අශ්වයාගේ ඔළුවේ වැහුවා. ආයිත් බීර බැරලයේ, තව පාරක් අශ්වයා මත මාරුවෙන් මාරුවට ඇය කැරකුණේ ගැමියාව කේන්ති ගස්සමින්. බීර බැරලයේ පියන මත ආයිත් වැහුවා විතරයි, ගැමියා පොරොවෙන් පියනටම ගැහුවා. මැයිනිය ඉක්මනින් ඉවතට පියඹද්දි ගැමියා ඇය පසුපස යන්නට වුණා. බැරලයෙන් ගලාගෙන ගිය බීර ඔක්කෝම බීගෙන බීගෙන ගියේ නරිදෙන තමයි.

ඔයාලා හිතනව ද නරිදෙන ආයේ මයින කූඩුව කිට්ටුවට ආවේ නෑ කියලා? හපොයි... මේ පාරත් මැයිනිය කූඩුවට පියඹගෙන යද්දි ම, නරිදෙන තමන්ගේ වලිගයෙන් ගහට තඩිබාමින් මෙහෙම අහනවා:

"මයින අම්මා, ඔයා මට කෑම හොයලා දුන්න නේද? "

"ඔව්, මම දුන්නා."

"මට බොන්න බීරත් හොයලා දුන්න නේද?"

"ඔව්, මම දුන්නා."

"එහෙනම් ඉතින් දැන් මාව හිනාගස්සවන්න. නැතිනම් දන්නවනේ, මගේ වල්ගෙන් ගහ කපනවා, ඔබත් ඔබේ පැටවුන්වත් මම ගිලිනවා."

ආයිමත් මැයිනියට සිද්ධ වුණේ නරිදෙන වික්ක ගමට යන්න. ඔවුන්ට දකින්න ලැබුණා ආච්චි කෙනෙක් එළදෙනකගෙන් කිරි දොවනවා. සීයා කෙනෙක් මේ ආච්චි අසළ වාඩිවෙලා පිදුරුවලින් සපත්තුවක් වියනවා. මැයිනිය පියාඹාගෙන ගිහින් වාඩි වුණේ ආච්චිගේ උරහිසක් උඩ.

"හෙලවෙන්න එපා, ඉන්න ඔය මයිනව අල්ලගන්නකම්." සීයා එහෙම කියපු ගමන් ආච්චිගේ උරහිසේ ඉන්න මැයිනියව අල්ලගන්න පැන්නා. කිරිල්ලිය නම් අහකට පියාඹලා ගිහිල්ලත් ඉවරයි. ඒත් ආච්චි තල්ලුවෙලා ගිහින් වැටුණේ කිරි දොවපු භාජනේට. අමාරුවෙන් නැගිට ගත්ත ඇය සීයාට බැන වැදුණා. මේ මෝඩ වයසක සීයා දිහා බලාගෙන නරිදෙන බඩ අල්ලගෙන හිනාවුණා.

තමන්ගේ කූඩුවට පියාඹලා ආව මැයිනිය පුංචි පැටවුන්ට කෑම කවන්නයි ලෑස්ති වුණේ. මෙන්න ආයෙත් පුරුදු දෙබස ඇහෙනවා:

"මයින් අම්මා මට කෑම හොයලා දුන්නා නේද ? "

"ඔව්, මම දුන්නා."

"මට බොන්න බීරත් හොයලා දුන්න නේද ? "

"ඔව්, මම දුන්නා."

"ඔයා මාව හිනැස්සුවා නේද ? "

"ඔව් මම ඔයාව හිනැස්සුවා. "

"එහෙනම් දැන් මාව බය කරලා පෙන්නන්න."

දැන්නම් කිරිල්ලියටත් හොඳට ම මහන්සියි. ඇය මෙහෙම කිව්වා:

"හොඳයි , ඔයාගේ ඇස් දෙක වහගෙන මගේ පස්සෙන් ම එන්න."

මැයිනිය නරිදෙන එක්ක කතා කරමින් ම ගියේ, ඇස් දෙක වහගෙන දිව එන නරිදෙනට පාර හොයාගන්න පුළුවන් වෙන්නයි. දඩයම් බල්ලෝ රංචුවක් කිට්ටුවට ගිය කිරිල්ලිය මෙහෙම කිව්වා:

"දැන් ඔයාට බයවෙන්න පුළුවන් නරි අම්මා."

නරිදෙන ඇස් ඇරපු ගමන් දැක්කේ තමා වෙතට වේගයෙන් එන බලු රංචුව. එයා කොච්චර බය වුණා ද කියනවා නම්, පස්ස බලන්නැතුව දිව්වේ තමන්ගේ ගුළට. බල්ලොත් ඒ පස්සේ ම පන්නනවා.

දුවලා දුවලා හති අරින ගමන් නරිදෙන තමන්ගෙන් ම මෙහෙම ඇහුවා:

"ඇස්, ඔයාලා මොකද කරමින් හිටියේ ? "

"අපි හොඳට බලාගෙනයි හිටියේ, බල්ලෝ ඔයාව කෑවෙ නෑ කියන එක ස්ථිරව ම දැනගන්නකම්."

"හොඳයි... කන්, ඔයාලා මොකද කරමින් හිටියේ? "

"අපි හොඳට ඇහුම්කන් දීගෙන හිටියේ, බල්ලෝ ඔයාව ගිල්ලෙ නෑ කියන එක හරියට ම දැනගන්න."

"හරි... කකුල්, ඔයාලා මොකද කළේ ? "

"අපි දිව්වා, බල්ලන්ට ඔයාව අල්ලන්න බැරිවෙන්න ම."

"ඒක ඇත්ත... වල්ගය, එතකොට ඔයා මොකද කළේ ? "

"මම දකින දකින පඳුරුවලින්, ගස්වල කඳන්වලින්, ඒ වගේ ම අතුවලින් අල්ලා ගත්තා.. ඔබට ඕනවට වඩා වේගයෙන් දුවන්න බැරි වෙන්න."

තමන්ගේ වල්ගය එක්ක කේන්ති ගත්ත නරිදෙන, ඒක ගුළෙන් එලියට හිටින්න තියාගෙන මෙහෙම 'හූ...' තිබ්බා:

"බල්ලෝ ඇවිත් අල්ලගන්න, මේ හිතුවක්කාර වලිගය! "

එහෙම කියනවත් එක්ක ම බලූ රංචුව නරිදෙනගේ වල්ගයෙන් ඇද්දා. හැබැයි එයාලට ලැබුණේ නරිදෙනගේ වල්ගය විතරක් ම නම් නෙවෙයි.

තමන්ගේ විනෝදයට කියලා අනිත් අයට කරදර කරන එකයි, ඒ වගේ ම කලබලයට තරහා ගන්න එකයි එච්චර හොඳ දේවල් නම් නෙවෙයි වගේ නේද?

කතාව - ඒ. එන්. තෝල්ස්තෝයි

චිත්‍ර - එවිගනී රාජේවි

නරිදෙන සහ මැයිනිය

චිත්‍ර - එව්ගනී රාජේවි

3+ 12-

kadullabooks.com

කඩුල්ල ප්‍රකාශන

LKR 300.00 KADULLA BOOKS

ISBN 978-624-6296-88-9

9 786246 296889

කඩුල්ල පාඨක සමාජය

කවරය සහ පිටු සැලසුම - පසිදු මිහිරාන් රුවිසල

pinterest.com/kadullapublishers
facebook.com/kadullapublishers
twiter.com/kadullaBooks
+94772583942
+94772583942